

# ආසියානු කලාපීය විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයේ අනාගතය

**(වර්ෂ 2001 අගෝස්තු මස 10 වන දා බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී විදේශ කටයුතු අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මහත්මා විසින් පැවැත්වුණු සබරගමු විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සව දේශනය ඇසුරෙන් සැකසුණු ලිපියකි. පරිවර්තනය-ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි)**

අතිගෞරවනීය මහා නායක හිමියනි, කුලපතිතුමනි, උප කුලපතිතුමනි, පීඨාධිපතිවරුනි, මහාචාර්යවරුන් සහ පීඨ ආචාර්ය භවතුනි, දෙමාපියනි, 2001 වසරේ උපාධිලාභිනි, නෝනාවරුනි, මහත්වරුනි,

'සෑම පුද්ගලයෙකුට ම අධ්‍යාපනයක් සඳහා අයිතියක් ඇත' යන්න සහ 'සෑම පුද්ගලයෙක් ම සතු ව උසස් අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශ වීමට සමාන හිමිකමක් ඇත' යන්න මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තියේ 26වැනි වගන්ති ප්‍රකාර තහවුරු කර ඇති බව බොහෝ දෙනාට අමතක ව ගොස් ඇතත්, ඇතැමුන් ගේ මතකයේ රැඳී ඇති එකී හිමිකම පැහැදිලියි. විවාදයට තුඩු දී ඇත්තේ එහි භාවිතයයි.

අප සාකච්ඡාවට බඳුන් කළ යුතු ගැටලු වූ කලි අද්‍යතනයේ උසස් අධ්‍යාපනයේ අරමුණු මොනවාද ? උසස් අධ්‍යාපනය උදෙසා වන ශාස්ත්‍රාලයන් විසින් මතු කරනු ලැබ ඇති වටිනාකම මොනවාද? උසස් අධ්‍යාපනය සම්බන්ධ විශ්වවිද්‍යාලයේ භූමිකාව කුමක් ද? එමෙන්ම සමාජය විෂයයෙහි විශ්වවිද්‍යාලයේ ස්ථානය කුමක්ද? විශ්වවිද්‍යාලවලට සහ උසස් අධ්‍යාපන ශාස්ත්‍රවලට අදට අභිමුඛ වී ඇති අභියෝග හා හෙට දිනයේ අභිමුඛ වන අභියෝග මොනවා ද? මේවා අනුයමින් මතු වන ඒකාබද්ධ අර්බුද විශාල ප්‍රමාණයකි.

විශ්වවිද්‍යාලයේ සමාරම්භක ස්වරූපය තීරණය කළ බලපෑම නම් සමාජගත ඉල්ලුම, ඥාන ගවේෂණයේ රුචිකත්වය, ඉගෙනුමට ඇති කැමැත්ත හා ස්වාධීනතා පුළුල් කර ගැනීමට ඇති අධිෂ්ඨානය හා චිරස්ථායී වටිනාකම ය. විශේෂයෙන් බටහිර ලෝකයේ දී තෙවැනි සහශ්‍රකය තුළ මේවා ඔපවත් වෙමින් අඛණ්ඩ ව ගමන් කෙරෙනු ඇත. කෙසේ වුව ද මේවාට සමීප වීමට විශ්ව විද්‍යාලයන් හා ආසියාතික විශ්වවිද්‍යාලයන් හි දී ඒවායේ තියුණු වෙනසක් දැකිය හැකියි.

ජාතියක ආත්මය නිවසන්නේ එහි සරසවිය තුළ ය. ජාතියක ස්වරය නැඟෙන්නේ එහි සරසවි කෙරෙනි. ජාතියක විඥානය සංවර්ධනය විය යුත්තේ ද සරසවි කෙරෙනි. ජගත් සම්මේලනය මෙන් ගත් කල මනුෂ්‍යත්වයේ වැළපීම, සොම්නස කතාබහ, චින්තනය ආදී සියල්ලේ සංකලනය වූ කලි ලොව විශ්වවිද්‍යාලයෝ ම වෙති.

කුලපතිතුමනි, අවසාන වශයෙන් සංකල්පීය මට්ටමින් මඳකට ඉවත් වී දශක කිහිපයකට ඉහත හා අද්‍යතන උසස් අධ්‍යාපන මට්ටම මා සතු න්‍යාය සහ සාමාන්‍යකරණයේ ප්‍රායෝගික අත්දැකීම මගින් සසඳනු රිසියෙමි. මේ අනුව වසර 50ට ඉහත මාගේ සරසවි ස්මාරක පටු මඟ දිගේ අතීතයට යාමට මොහොතකට අවකාශ පතමි. වර්ෂ 1950 වසරේ මම කොළඹ පිහිටි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට සම්බන්ධ වන විට (කලින් එය යුනිවසිටි කොලීජිය ලෙස හැඳින්වුවද) එය අට අවුරුදු වියැති බොහෝ වියපත් ලන්ඩන් විශ්වවිද්‍යාලයීය අනුබද්ධිකාවක් ව සිටියා ය.


ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය, බ්‍රිතාන්‍ය නේවාසික සරසවියක ශාස්ත්‍රීය ආදර්ශය සහිත ව දක්නට ලැබිණි. ඊට ඇතුළත්වීම දුෂ්කර විය. වර්තමාන අ.පො.ස. (උ/පෙළ) හා සම වූ උසස් පාසැල් සහතික පත්‍ර විභාගය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ශිෂ්‍යයෝ විශේෂ තරගකාරී විභාගයක් සඳහා පෙනී සිටිය යුත්තාහ. විශ්ව විද්‍යාලයේ අවකාශ සීමා සහිත වූ නිසාම තරගකාරීත්වය ද උග්‍ර විය. එකී දුෂ්කර තරගකාරී පබැඳුම සමත් ව සරසවියට ප්‍රවේශ වන ශිෂ්‍ය සංඛ්‍යාව අදට වඩා බෙහෙවින් පහළ අගයක තිබිණි. එකී පහළ සංඛ්‍යාවකින් අදට වඩා සමීපතම වූ ගුරු-ශිෂ්‍ය සහසම්බන්ධතාවක් ජනිත විමයි. සාමාන්‍යයෙන් එකල අදට වඩා කුඩා සිසු පිරිසකට ඉගැනුම් ක්‍රම මගින් කරුණු සපයා දෙන ලද අතර, ඒවා අද භාවිත ක්‍රමවලින් සාකල්‍යයෙන් ම වෙනස් බව කිව යුතුයි. විෂයක් ගැඹුරින් හැදෑරීමේ අරමුණේදී එකල බෙදා දෙන ලද සටහන් පිළිබඳ ප්‍රශ්නයක් නොවී ය. ශිෂ්‍යයන් ගෙන් සපිරි ශාලාවක දේශකයාණන් සිය සටහන අනුව දේශන කළ අතර, ඔහු ගේ දේශනය යොදා ගනිමින් අපේම සටහනක් පිළියෙළ කර ගැනීම ශිෂ්‍යයන් ගෙන් අපේක්ෂිත විය. සංක්ෂිප්ත ව නිවැරැදි ව හා ශීඝ්‍ර ව සටහන් තබා ගැනීම වූ කලි එක්තරා කලාවක් වන අතර, මෙය කාලීන ව යහපත් ප්‍රතිඵල ගෙන දෙන ලාභයක් විය.

අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ විෂය විවිධත්වයක් සහිත වූ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සුවිශාල පුස්තකාලය යි. පෘථුල කියවීමක් සහ තමා විසින් ම ගැටලු විශ්ලේෂණය කර ගැන්මක් සිසුන් ගෙන් අපේක්ෂා විණි. දක්ෂ සිසුහු ඉහළ ප්‍රතිඵල දිනා ගත්හ. මක්නිසාද මඳ ප්‍රතිඵල ගත් සිසුන්ට වඩා ඔවුන් ගේ කියවීම අධික වීම, අවබෝධයේ ධාරිතාව හා ඉදිරිපත් කිරීම මෙන්ම විස්මිත මතක ශක්තිය ද ඉහළ තැබූ බැවිණි.

ඉහළ ඉංග්‍රීසි දැනුමක් හෙවත් අපේ පරපුරේ දැනෙහි තිබූ අනර්ඝ වාසනාවේ රුවන්මය යතුර පිළිබඳ නිරීක්ෂණයට මම මඳ විරාමයක් මෙහිදී ගත යුත්තෙමි. පුස්තකාලයේ අගුලු නොදැමූ ඥාන භාණ්ඩාගාරය විසින් සමස්ත මනුෂ්‍ය වර්ගයා ගේ සාහිත්‍ය උරුමය අප හමුවේ විවෘත කරන ලදී. අප ගේ සරසවිවල හා පාසල්වල උපදෙස් සම්පාදනය කරන නිල භාෂා මාධ්‍ය සිංහල හා දෙමළ නොවිය යුතු යැයි යන මතය සමග මම එකඟ නොවෙමි. මෙහි ප්‍රතිපක්ෂය නම්, යටත් විජිත සමය තුළ කෙදිනකවත් භාවිත නො කළ තත්ත්වයකින් නිදහසින් පසු ජාතික භාෂාවෙහි ඇති වූ උන්නතිය නැතහොත් ඉංග්‍රීසි ඥනයේ ඌනතාව නිසා සම්පූර්ණයෙන් ම


ප්‍රතික්ෂේප ව සිටි අපේ ජනතාවට අධ්‍යාපනයක් ලැබීමේ පැහැදිලි බහුතර අවස්ථාවක් සලසා දීමයි. සිංහලයට හා දෙමළයට ඔවුන් ගේ නිසි ස්ථානයක් දීම අනුකම්පාව නො වන අතර, ඉංග්‍රීසිය අනතුරට වැටීමේ අවකාශ සැලසිණි. කෙසේ වුව ද අප ගේ තාරුණ්‍යය සඳහා එක් ද්වාරයක් වැසුණු අතර එක් ද්වාරයක් විවර වුණි. වැසුණු ද්වාරය වූ කලි අප ගේ කොදෙව්ව වෙරළ පිටුපස ඇති විශ්වයට ප්‍රවේශ වන පුළුල් කවුළුවයි.

මගේ ස්ථිර හා දීප්තිමත් ස්මාරක සහිත ඒ අතීත වකවානුවට නැවත ගිය විට මට පැහැදිලි ලෙස කිව හැකි කරුණ නම් තාරුණ්‍යයේ පසු වූ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය වූ කලි යහපත් සරසවියක් යනු කෙබන්දක් දැයි පැහැදිලි වන ආකෘතියක් තමා වෙතම තිබූ ආයතනයකි. ඉතා පෞරාණික සහ වඩා ජනප්‍රිය බටහිර සරසවි මඟින් ලබා දෙන ලද මූලිකාංගයෝ එය සතු වූහ. මට ඒ සැසඳීම කළ හැකි ය. මක් නිසා ද කොළඹ සහ පේරාදණියේ මගේ සරසවි අධ්‍යයන කටයුතුවලින් ඉක්බිති මගේ වෘත්තීය අධ්‍යාපනය උදෙසා ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ද වසර කිහිපයක ඇවෑමෙන් ඔක්ස්ෆර්ඩ් සරසවියට ද නික්ම යාම නිසා ය. මා විසින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ අත්විඳි ස්වල්පයකට ප්‍රථම විස්තර කරන ලද සියලු මූලිකාංගයන් එහිදී වඩාත් උසස් හා පෝෂිත මට්ටමින් මම දිටිමි.



ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතිවරයා වූයේ 'පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාව නොහොත් සෝල්බරි ව්‍යවස්ථාව' යයි ප්‍රකට ව්‍යවස්ථාවේ ද මූලිකාංග සැලසුම් කළ ඉතා ප්‍රකට බ්‍රිතාන්‍ය ව්‍යවස්ථා සම්පාදක නීතිඥවරයෙකු වූ ශ්‍රීමත් අයිවර් ජෙනින්ස් ය. මගේ මතකය අනුව තරුණ නීති ශිෂ්‍යයන් 12ක් වූ අපේ ප්‍රථම වසර දේශනවලදී ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ විශිෂ්ට ව්‍යක්ත දේශනයක් කරනු ලැබුයේ ශ්‍රීමත් අයිවර් ජෙනින්ස් විසින් මිස අනිකකු විසින් නො වේ. ශනිදා පෙරවරු කාලවලදී ආණ්ඩුක්‍රම සම්පාදන ක්‍රියාවලිය පිළිබඳ අගනා ප්‍රඥාව අප වෙත හෙතෙම ලබා දුන්නේ ඊට දෙවසරකට පෙර ඒ සම්බන්ධ ව බරපතළ ලෙස සමීප ව සිට ලබාගත් අත්දැකීම් මතයි.

පේරාදෙණියේ නව නේවාසික සරසවි මණ්ඩපයක් තනවමින් ශ්‍රීමත් අයිවර් එහි ප්‍රථම උපකුලපති ලෙස භාරකරුවා වූ අතර, ඔහු ගේ නිල කාලය තුළ සරසවිය කොළඹ සිට පේරාදෙණියට ගෙන යන ලදී. පේරාදෙණියේ විශ්වවිද්‍යාලය සඳහා හොඳ දැක්මක් ශ්‍රීමත් අයිවර් සතු විය. සෑම ශිෂ්‍යයෙකු සඳහාම සුවිසල් අවකාශයක් ලැබෙන පරිදි ගොඩනැගිලි ඉදිවිණි. සෑම විද්‍යාර්ථියකු හෝ විද්‍යාර්ථිනියකම සඳහා වෙනම කාමරයක් ලබා දීම මූලික සංකල්පය විය. භූමිය හා උද්‍යානය මනෝරම්‍ය ලෙස සැලසුම් කෙරිණි. වටපිටාව ශාන්ත හා සුවදායී විය. පේරාදෙණිය වූ කලී ඔක්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් ආකෘතියක් ලෙස නිර්මාණය කිරීමේ ශ්‍රීමත් ජෙනින්ස් ගේ දර්ශනය පැහැදිලි ලෙස ක්‍රියාවට නැගිණි. නමුදු එම දැක්ම සර්ව සම්පූර්ණ නොවී ය. සත්‍ය වශයෙන් ම එය යථාර්ථවත් ලෙස මුල් නො ඇදිණි. මක්නිසා ද යත් සාකල්‍යයෙන් ම විසම වූ සංස්කෘතියක පෝෂිත වූ ශාස්ත්‍රාලයක් එහි පිට දේශක්කාර භූමියෙන් උපුටා ගැනීමට යත්න දැරීම හා මෙරට තුළ ප්‍රගුණ වී තිබූ සම්ප්‍රදායන් හා චර්යාවන් මත ප්‍රතිරෝපණය කිරීම වනාහි ඉරණමට කැප වූ අසාර්ථක ව්‍යාපෘතියක් විය. ඉතා ඉක්මනින්ම පැහැදිලි වූයේ කේම්බ්‍රිජ් ආකෘතිය පේරාදෙණියේ දී නො දරන බවයි. වෙනත් කරුණක් නිසා නො ව පේරාදෙණියට වඩා ඉතා ඉහළ සිසුගුරු අනුපාතයක් සහිත



# කලාව හා බුදුදහම

ඔක්ස්ෆර්ඩ් හා කේම්බ්‍රිජ් පළපුරුදු ශාස්ත්‍රීය හා සමාජීය පරිසරය ප්‍රතිනිර්මාණය කිරීමට අසමත් අසාර්ථක පිරිසක් පේරාදෙණිය බිහි කළ නිසයි. මේ නිසා ඉතා ශීඝ්‍රයෙන් පේරාදණිය පත් වුයේ ප්‍රධාන වශයෙන් රැකියා වෙළෙඳපොළට උපාධිධාරීන් බිහි කරන කම්හලක් බවටයි. එකල සරසවියට ඇතුල් වූ අප සැම එසේ කළ අතර අප ගේ මව්පියන් සිතුයේ උපාධිය වූ කලි රැකියාවට බලපත්‍රයක් බවයි. මෙසේ පැවසීම සත්‍යයක් ලෙස මම සිතමි. එය කිසි විටෙක වරදක් නොවේ. වර්තමානයේ නැඟෙන ප්‍රශ්න නම් විශ්වවිද්‍යාලයක සමාජගත චරිතය සාමාන්‍යකරණය කළ යුත්තේ රැකියා සඳහා උපාධිධරයන් නිපදවීමේ ධාරිතාව මතු නැතහොත් සමාජයට මුල් ඇදුණු මහා උදාරත්වයක් වඩා පෘථුලභාවයක් හා දූරදර්ශී භූමිකාවක අන්තර් ක්‍රියාකාරීත්වය මත විය යුතු ද යන්න මේ දේශනය තුළ මේවා මා විසින් මතු කරන ලද ප්‍රශ්න කිහිපයක් වන අතර, ඉතා සංක්ෂිප්තයෙන් පිළිතුරු දීමට ප්‍රයත්න දැරීමි.

ඔබ ගේ විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ විෂය අත්පොතෙහි මම මේ වැකිය කියවීමි. එනම් '21 වන සියවසෙහි අභියෝග භාර ගන්නා නම්‍යශීලී ආත්ම විශ්වාසී හා නවීන පන්නයේ විශ්වවිද්‍යාලයීය උපාධිධරයෙකු තැනීමට අපි මහත් පරිශ්‍රමයක් දරමු' යන්නයි. කුලපතිතුමනි. නූතන යුගයේ විශ්වවිද්‍යාලය අධ්‍යාපනයේ අභිමතාර්ථ මෙතරම් සංක්ෂිප්ත, පැහැදිලි, ශෝභමාන ලෙසත් දරන්නා වූ සරසවියක සම්මාන ආචාර්යෝපාධියක් ලැබීම මහත් අභිමානයක් ලෙස හැඟීමි. සබරගමුව සරසවියේත් එහි ගුරු සිසු හා කාර්ය මණ්ඩලයේත් අභිවෘද්ධිය අඛණ්ඩ ලෙස සෞභාග්‍යයට පත් වෙයි. ■

නතේ කාමා යානි චිත්‍රානි ලෝකේ
සංක්‍ය පරාගො පුරිසස්ස කාමො
තිට්ඨානි චිත්‍රානි තථෙව ලෝකේ
අථෙත්ථ ධීරා විනයාති ජන්දං

'ලොවේ පවතින්නා වූ විචිත්‍ර වස්තූන් කිසිවිටෙකත් කාමුක වස්තූන් නොවෙයි. නුවණැත්තෝ විසින් එහි ඇල්ම දුරු කෙරෙති. විචිත්‍ර වස්තූන් එලෙසම ලොව පවතියි.'

(බුදුරදුන්-සංයුක්ත නිකාය)

පසුගිය සියවස් විසිපහ මුළුල්ලේම බුදුදහම කලාවේ පෝෂණය සඳහා වූ දායකත්වය බුදු දහම ව්‍යාප්ත වූ සියලුම බෞද්ධ රටවල කලාවට අවධානය යොමු කිරීමෙන් ප්‍රත්‍යක්ෂ වේ. ශ්‍රී ලංකාව ජපානය, චීනය, තායිලන්තය, මියන්මාරය හා කොරියාව යන රටවල ඇති කලාව මෙයට හොඳම නිදසුන් ය. මෙලොව ඇති සියලුම විෂයන් බිහි වී ඇත්තේ මානුෂීය අවශ්‍යතා පදනම් කරගෙන ය. කලාව ද එසේ ය. කලාව සෞන්දර්යයේ මාධ්‍යය මිස කිසිදු කලාවක් සෞන්දර්යම නො වේ. තව ද බුදු දහම ප්‍රචලිත වූ කවර රටක වුව ද කලාවේ ප්‍රතීයමාන වූයේ බුදු දහමයි.

බුදු දහම හා සබැඳි කලාව නිරාමිස සුවයක් නිරාමිස කලා සෞන්දර්යයක් විඳීම සඳහා ඇති මාර්ගයයි. වර්තමානයේ අප දකින කලාව හා බෞද්ධ කලාව බොහෝ සෙයින් අසමාන ය. වර්තමාන සමාජය කලාත්මක නො වන දේ කලාත්මක යැයි පැවසීමට තරම් කලාව පිළිබඳ නො දන්නවුන් රුචිකත්වයක් දක්වයි. නමුත් අප මෙහි දී විමසා බැලිය යුත්තේ බුදු රදුන් හා මහරහතන් වහන්සේ ලා භුක්ති විඳි කලාව කුමක්දැයි යන්න විමසා බැලීමයි.